## 2020 වසරේ අගෝස්තු මස තුළ ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සේවාවන් සැපයීම

වර්තමානයේ ලොව පුරා සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන COVID-19 වසංගත තත්වය හේතුවෙන්, ශ්‍රී ලංකා විදේශ දූතමණ්ඩල සඳහා සේවා ලබා ගැනීමට පැමිණෙන ජනතාව අතර වෛරසය පැතිරීම පාලනය කිරීම සඳහා, 2020 මාර්තු මස 16 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල වලින් ඉටුකෙරෙන (කොන්සියුලර්) රාජකාරීන් සීමා කිරීමට ශ්‍රී ලංකා විදේශ සබඳතා අමාත්‍යාංශය විසින් තීරණය කර ඇත.

ප්‍රංශ රජය විසින් ජනතාව ගැවසීම සීමා කිරීම සම්බන්ධව පනවා ඇති නීතින් ලිහිල් කිරීම පිළිබඳව ක්‍රියාත්මක කර ඇති වැඩ පිළිවෙලේ තෙවන අදියරට අනුකූලව, ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය කොන්සියුලර් සේවාවන් සඳහා අගෝස්තු මාසයේ දී සඳුදා, බදාදා සහ සිකුරාදා දිනයන් හිදී පමණක් මහජනතාව සඳහා විවෘතව තැබීමට තීරණය කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

ඒ අනුව ඉහත දිනයන්හීදී පහත දුරකථන අංක වෙත අමතා හෝ SMS මගින් පෙර වෙන්කරවාගත් වේලාවන් අනුව මහජනතාවගේ සියළු සේවා සැපයෙනු ඇත.

රාජකාරී වේලාවන් තුළදී (පෙ.ව. 9.00 සිට ප.ව. 5.00 දක්වා)

**පොදු දුරකථන අංක:** - **+33 1 55 73 31 31**

- **+33 6 77 04 81 17**

**හදිසි කොන්සියුලර් සේවා** - **+33 6 20 97 70 90**

ඔබගේ අවශ්‍යතාවයන් ඉටුකර ගැනීම සඳහා කලින් දින වෙන්කරවා ගැනීමට සහ ඒ සම්බන්ධ තොරතුරු ලබා ගැනීමට ඉහත දුරකථන අංක සමග ඇමතුම් මාර්ගයෙන් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ වන්න.

**ශ්‍රී ලංකා තානාපති කාර්යාලය**
**ප්‍රංශය**